# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## කාර්ය මණ්ඩල පුරප්පාඩු

**රියදුරු**

**ශ්‍රේණිය - DV** **තනතුරු ගණන – 01**

**වේතන**

• මූලික වැටුප - රු. 40,834/- බඳවා ගැනීමේදී මූලිකව ගෙවනු ලැබේ. (වැටුප් පරිමාණය - රු.. 43,280- 10x490-10x540-10x590-12x630 – 67,040 - 01/2025

2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.).

• රු 119,666/- වූ දළ මාසික වැටුපක් ලබා ගත හැකි වේ.

• වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණ ප්‍රතිපාදන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනා

**සුදුසුකම් සහ පළපුරුද්ද**

උපරිම වශයෙන් වාර දෙකකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයෙහි විෂයයන් හයක් (06) සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත් වීම.

**සහ**

මෝටර් රථ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරනලද වාහන නව කාණ්ඩය යටතේ A1, A, B1, B, C1, C, D සහ D යන කාණ්ඩවල හෝ පැරණි කාණ්ඩය යටතේ A, A1, B, B1, C, C1, D, E, F යන කාණ්ඩවල රියදුරු බලපත්‍රයක් තිබීම හා රිය අනතුරක් හෝ දඩුවමක් හෝ සම්බන්ධයෙන් සටහනක් නොමැතිව රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීමේ අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද තිබීම;

**සහ**

රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක රියදුරෙකු ලෙස රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු පහක (05) පළපුරුද්දක් තිබීම;

**සහ**

අයදුම් කළ දින සිට දින තිහක් (30) ඇතුළත වූ ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් ශාරීරික යෝග්‍යතාව (වර්ණ අන්ධතාවයෙන් තොර ඇස් දෙකෙහිම දෘෂ්ටිය 6/6 යන්න ඇතුළුව) සහතික කරන ලද වෛද්‍ය සහතිකය

**වයස් සීමාව**

| **තනතුර** | **වයස් සීමාව** |
|---|---|
| රියදුරු | අපේක්ෂකයින් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |

- වැඩි විස්තර සඳහා රැකියා විස්තරය සහ සම්මත අයදුම්පත **(Standard Application form)** CAASL නිල වෙබ් අඩවියෙන් www.caa.lk වෙතින් බාගත හැකිය.
- අයදුම්පත් සමඟ තනතුරු සඳහා ඔබේ සුදුසුකම් සනාථ කිරීම සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සඳහා ලේඛන සාක්ෂි පිටපත් එවිය යුතුය (employment@caa.lk.)
- සම්මත අයදුම්පත අනුව එවන ලද අයදුම්පත් පමණක් පිළිගන්න අතර ඕනෑම රජයේ ආයතනයක සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා හරහා ඉල්ලුම් කළ යුතුය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැල යටතේ 2026.02.14 දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට යොමු කල හැක.
- අයදුම්පත් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය, අංක 152/1, මීනුවන්ගොඩ පාර, කටුනායක වෙත යොමු කළ යුතු අතර අයදුම් කරන තනතුරේ මාතෘකාව ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සලකුණු කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණ / පරීක්ෂණ සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් නිර්ණායකයන් සපුරාලන අපේක්ෂකයින් පමණි.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 152/1,
මීනුවන්ගොඩ පාර,
කටුනායක.
2026.02.03

**Details**
Last Updated: 03 February 2026